ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා

අවසාන පරීක්ෂණය 2004/2005

අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය - **ESP 1106**

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.07.22 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

I වන කොටසේ සියළුම ප්‍රශ්නවලටත් II කොටසින් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I කොටස

01. අධ්‍යාපනික මාර්ගෝපදේශය හා අධ්‍යාපනික උපදේශනය යන සංකල්ප වෙන් කොට දක්වන්න.

02. වෘත්තීය මාර්ගෝපදේශයේ සහ උපදේශනයේ ප්‍රධාන අරමුණු තුනක් (03) සඳහන් කරන්න.

03. සිසු සමායෝගය සහ ඵලදායී ඉගෙනුම අතර ඇති සම්බන්ධතාවය පැහැදිලි කරන්න.

04. උපදේශන න්‍යායය පිළිබඳ දැනුමක් ගුරුවරයෙකුට අවශ්‍ය වන්නේ යයි ඔබ සිතනවා ද? ඔබේ පිළිතුරට ප්‍රධාන හේතු දෙකක් දක්වන්න.

05. එලී ගින්ස්බර්ග්ගේ වෘත්තීය තේරීම් න්‍යායයේ සඳහන් වෘත්තීය තේරීම් න්‍යායයේ සඳහන් වෘත්තීය තේරීම් සිදු කරන අවස්ථා තුන සඳහන් කරන්න.

06. පාසල් උපදේශනයේදී ප්‍රත්‍යෙක වාර්ථා කොතෙක් දුරට ප්‍රයෝජනවත් වන්නේ දැයි කෙටියෙන් සාකච්ඡා කරන්න.

07. ස්වභාවික ව්‍යසනයකට මුහුණ දී දිවි ගලවාගත් පාසල් සිසුන් සඳහා උපදේශන අවශ්‍යතාවය පිළිබඳව කෙටියෙන් අදහස් දක්වන්න.

08. 'පාසෝනියන් ආකෘතිය' යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

## II කොටස

09\. i. පාසල් උපදේශන සේවාවන්හි සාර්ථකත්වය සහතික කරන ප්‍රධාන මග පෙන්වීම් තුනක් (03) සඳහන් කරන්න.

ii. පාසල් සිසුන්ට අධ්‍යාපනික උපදේශනය ලබාදීමේදී මෙම එක් එක් මගපෙන්වීම උපකාරී වන ආකාරය සුදුසු උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

10\. i. 'ඉගෙනුම් දුෂ්කරතා' සහ 'ඉගෙනුම් නොහැකියා' යන සංකල්ප පැහැදිලි කරන්න.

ii. ඉගෙනුම් දුෂ්කරතා සහිත සිසුන් කිහිප දෙනෙකු සිටින පන්තියකට ඉගැන්වීමෙහි යෙදෙන ගුරුවරයෙකුට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග මොනවා ද?

iii. ඉහත ii.හි ඔබ සඳහන් කල අභියෝගවලට සාර්ථකව මුහුණදිය හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

11\. 21 වන සියවසෙහි නව යෞවනයෙකුට, සමායෝගී පෞරුෂයක් ගොඩ නගා ගැනීමට සහය වීමේදී පාසල සතු භූමිකාව විභාග කරන්න.

12\. දෘෂ්ටි දුර්වලතා ඇති සිසුවෙකුට හෝ ශ්‍රවණ දුර්වලතා ඇති සිසුවෙකුට පන්ති කාමරයේදී සහය විය හැකි ආකාරය පිළිබඳව පහත සඳහන් කරුණු ඇතුළත් සවිස්තරාත්මක වාර්තාවක් පිළියෙල කරන්න.

අ. එම සිසුන් හඳුනා ගන්නා ආකාරය.
ආ. එම සිසුන් සඳහා සැලසුම් කරන ප්‍රතිකාරාත්මක ක්‍රියාකාරකම්.
ඇ. ප්‍රතිකාරාත්මක ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම.

13\. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් තෝරාගෙන, එක් එක් මාතෘකාව පිළිබඳව සටහන් ලියන්න.

i. දුස්සමාහිත සිසුන් සමග කටයුතු කිරීමේදී ගුරු කාර්යභාරය
ii. ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය මගින් පවත්වා ගෙන යනු ලබන උපදේශන සේවා.
iii. පළමුවන ශ්‍රේණියට ඇතුලත් වන ශිෂ්‍යයකු තුළ ඇතිවිය හැකි පාසල් භීතිකාව.

14\. සිසු උපදේශනය ගුරුවරයෙකුට අයත් ප්‍රධාන කාර්‍යයක් ලෙස සැලකුව ද, වර්තමාන ශ්‍රී ලාංකීය සන්දර්භයෙහිලා මෙම කාර්‍යය පහසුවෙන් ඉටුකළ හැකි නොවේ.' මෙම ප්‍රකාශය විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

\- හිමිකම් ඇවිරිණි. -